

# අසරණ කිටී සහ හිත හොඳ මලී

විහඟි පොද්දල්ගොඩ

6D

මහාමායා බාලිකා විදුහල

මහනුවර

# අසරණ කිටී සහ හිත හොඳ මලී

ISBN-978 -624-208-164-9

**කතෘගේ වෙනත් කෘති**

**අඩන කුඩේ**

ISBN-978 -624-206-586-1

කතාව හා චිත්‍ර:

**විහඟි පොද්දල්ගොඩ**

**6D**

**මහාමායා බාලිකා විද්‍යාලය**

**මහනුවර**

**2025.02.08.**

# පිදුම

කතුවරියක් වීමේ
සිහිනයේ දොරටු මා
වෙත විවර කරදුන්
ආදරණීය මහමායා විදු
මාතාවට බැතියෙන්
පිළිගන්වමි.

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි.ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධමත් කාල පරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන්ම ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිටියේ අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුව යි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩනගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත් කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදී කතෘ කරදන අත්ථදස්සී මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමු කරන "**හෙරණගත්කරණී**" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය හා ශාසනික සේවාවන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛනකරණයට යොමු වීමේ ප්‍රතිඵලයක් ලෙස එළි දකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

විදුහල්පතිනිය

ශෂිකලා සේනාධීර

මහාමායා බාලිකා විද්‍යාලය මහනුවර

ඔන්න එකෝමත් එක රටක මලී කියලා පොඩි ළමයෙක් හිටියා.මෙයා සත්තුන්ට ගොඩාක් ආදරෙයි.

ඒ උනාට මෙයාට සුරතලෙක් හිටියේ නෑ.

මෙයාට අඩු තරමේ සහෝදර සහෝදරියන්  කවුරුත් ම හිටියේ නෑ.



ඉතින් මලී ඇවිද ඇවිද
ඉන්නකොට ගේට්ටුව ගාව
පූසියක් අඬනවා දැක්කා.



මලී ගිහිල්ලා ඒ පූසිගෙන් ඇහුවා ,
"ඇයි අඬන්නේ" කියලා.

එතකොට පූසි කිව්වා ,

"මගේ පැටියා නැතිවෙලා.

මට එයාව කොහේවත්

හොයාගන්න බෑ.




එයා අළු පාටයි.

එයාගේ නම අළු.

ඔයාට පුළුවන්ද එයාව හොයන්න

උදව් කරන්න."

"අනේ ඕක මොකක්ද.මම ඔයාට

එයාව හොයලා දෙන්නම්."

ඉතින් මලී මිදුල පුරා ,

ගේ ඇතුලේ , පාරේ , හැම තැනම

පුංචි පූස් පැටියාව හෙව්වා.

ඒත් මලීට අළුව කොහේවත්

හොයාගන්න බැරි උනා.

ඉතින් මලීට හරි දුකයි.

මෙයා ඊට පස්සේ දැන්වීම් හදලා

ගස්, තාප්ප හා ලයිට් කණුවල

ඇලෙව්වා.



ඉතින් මේ දැන්වීම දැකලා
මිනිස්සු ලහි ලහියේ ඒ
ගොල්ලොන්ගේ තිබ්බ වැඩ
නවත්තලා පූසාව හෙව්වා.

ඒකට හේතුව අළුව හොයලා
දෙන ඕනෙම කෙනෙක්ට විශේෂ
තෑග්ගක් දෙනවා කියලා කිව්ව
නිසා.



දිනකට පසු,

අළු පාරේ නිදාගෙන ඉන්න වෙලාවේ වෙන පූසෙක් ඇවිත් එයා එක්ක කතා කරා.

අළු එයා කවුද කියලා ඇහුවා.

එතකොට ඒ පූසා "මම ලිලී,මම මේ පාරේ තමා ජීවත් වෙන්නේ.කෝ ඔයාගේ අම්මා? " කියලා ඇහුවා.ඊට පස්සේ අළු අඬන්න ගත්තා.

"මම දවසකට කලින් ඇවිද ඇවිද

ඉඳලා අම්මව මඟ හැර ගත්තා.

දැන් මට අම්මව

හොයාගන්න බෑ.

මට අම්මව ඕනේ!!!" කියලා

අඬන්න ගත්තා.



ඉතින් ලිලීට අළු ගැන දුක හිතිලා එයාගේ අම්මා ගාවට එක්කගෙන ගියා.

එයාගේ අම්මගේ නම ඩේසි.

එයා ලස්සන පූසියක්.



"ආ... බබාට අලුත් යාළුවෙක් හම්බවෙලා වගේ ..."කියලා ඩේසි කිව්වා.

"ඔව් අම්මා. මේ ඉන්නේ

අළු.මෙයා ඊයේ ඇවිද ඇවිද ඉඳලා

අම්මා මඟ හැරිලා.දැන් අම්මා

ඕනේ කියලා අඬනවා.අම්මා අපි

එයාට එයාගේ අම්මව

හොයාගන්න උදව් කරමුද?"

"කවුද බෑ කිව්වේ.

අපි දැම්මම පිටත්

වෙමු.

අළු,ඔයාගේ අම්මා

කොයි වගේද?”



“එයාගේ හැඩරුව කිව්වොත් අපිට එයාව ඉක්මනට හොයාගන්න පුළුවන්.”

"එතකොට අළු කිව්වා." මගේ අම්මා අළු පාටයි.එයාව හොයාගන්න හරි  අමාරුයි.

අලු පාට පූසෝ ගොඩාක් ඉන්නවා.ඒ උනාට මගේ අම්මා හරි බෝලයි."



"එහෙනම් අපි දැම්මම යං."

"ස්තුතියි මගේ අම්මව හොයාගන්න ඔයගොල්ලො මට උදව් කරනවට."

"අනේ ඕක මොකක්ද.ඔයාට මොනවා හරි ඕනෙනම් කියන්න, හරිද? "ඩේසි කිව්වා.

"හරි හරි මං කියන්නම්."

ලිලීයි,ඩේසියි,අළුයි තුන්දෙනා ම අළුගේ අම්මව හොයන්න ගියා.

අලු පාට පූසෝ ගොඩ දෙනෙක් හම්බුනා.



ඒත් එයාලා අළුගේ අම්මා නෙමෙයි.

ඉතින් ඔහොම දවස් දෙකක් විතර ගතවෙලා අළුගේ අම්මා ඉන්න පැත්තට ආවා.

මනුස්සයෙක් ඇවිත් අළු දිහා බලලා ගෝනියක් අරගෙන අළුව පැහැර ගත්තා.

අළු කැගැහුවා.

"මාව බේරගන්න"කියලා.



ලිලී ඒ මනුස්සයව හීරුවා.

ඩේසි හපන්න පැන්නුවා.

ඒ මනුස්සයා බැන බැන ගියා.




මේගොල්ලෝ සතුටින් නැටුවා.

ඉතින් අළුලා තවත් ටික දුරක්

ඇවිද යනකොට...............

තවත් මනුස්සයෙක් ඇවිල්ලා

අළුව අල්ලගත්තා.



මේ මනුස්සයා ලිලීවයි ඩේසිවයි

තල්ලු කරා.



ඩේසිටයි ලිලීටයි කර කියාගන්න දෙයක් නැති වුනා.

මේ දෙන්නා අර මනුස්සයා පස්සේ ගියා.

එතකොටම වෙන මනුස්සයෙක් ඇවිල්ලා අර මනුස්සයාට ගහලා අළුව ගත්ත.

ඒ මනුස්සයා ටික දුරක් යද්දි වෙන මනුස්සයෙක් ඇවිල්ලා අළුව පැහැරගන්න හැදුවා.



ඩෙසිටයි ලිලීටයි හරි පුදුමයි. මිනිස්සු මේ තරමටම අළුට කැමතිද?

නෑ.අර දෙනවා කිව්ව තෑග්ග ගන්න මිනිස්සු පොරකනවා.

ඉතින් ලිලී කෑ ගහලා අළුට කිව්වා." අළු ඔය මනුස්සයව හූරලා දුවගෙන එන්න."කියලා.

ඊට පස්සේ ඩේසීයි ලිලීයි අළුට අර විස්තරේ කිව්වා.

ඊට පස්සේ මේ තුන්දෙනා මෙතනින් ඉක්මනට ම ගියා.

මේගොල්ලෝ අඩමින් ඉන්න පූස් අම්මා කෙනෙක් දැක්කා.

දෙයියනේ ඒ අලුගේ අම්මා!

අළුගෙ සතුටට කඳුළු ආවා.



එයා කිව්වා."ඔය දෙන්නත් මාත් එක්ක එන්න"කියලා.

ඊට පස්සේ මේ දෙන්නත් එක්ක ගේ ඇතුළට යනකොට ම ඩේසි කිව්වා."මම මෙතන ඉන්නම්.මාව

ඇතුලට ගන්නේ නැතිවෙයි.ඔය දෙන්නා යන්න" කියලා.

ඉතින් ලිලී දුකෙන් ගියා.

මේ දෙන්නා ඇතුළට යනකොටම අළුගේ අම්මා ඇවිල්ලා අළුව ලෙවකෑවා.



"අනේ මගේ පුතේ ඔයා ඔච්චර කල් කොහෙද ගිහිල්ලා හිටියේ.මගේ ලේ වතුර වෙලා තිබ්බේ.ඔයා දන්නෑ මං කොච්චර අමාරුවෙන්ද හිටියේ කියලා.මං ගොඩක් බය වුණා.ඔයා ආවේ නැත්තං මට පපුවේ අමාරුවක් හැදිලා මැරෙන්නත් තිබ්බා." අම්මා එකදිගට කියාගෙන ගියා.

"අනේ අම්මේ ඔච්චර

බය වෙන්න එපා.

මාත් දැන් ලොකුයිනේ

මාත් පොඩ්ඩක් ඉතින්

ඇවිදින්න ගියා."




"හොඳ පොඩ්ඩ!අනේ...මේ කවුද?"අම්මා ඇහුවා.

"අම්මා මේ ඉන්නෙ ලිලී.මෙයා තමා මට ඔයාව හොයාගන්න උදව් කරේ."



එතකොටම මලී දුවගෙන ඇවිල්ල "ආනේ මෙයාද ඔයාගේ පැටියා.." කියලා අළුව වඩා ගත්තා.



එතකොටම

ඬේසි අඬනවා

අළුගේ අම්මා

දැක්කා.

අළුගෙ අම්මා

ඇහුවා..

"ඇයි ඔයා

අඬන්නේ"

කියලා.

"මමත් ආසයි ලිලී වගේ මේ ගෙදර ඉන්න."

"ඉතින් එන්නකෝ" අළුගේ අම්මා කිව්වා.

ඊට පස්සේ ලිලී, අළු, අළුගේ අම්මා,ඩේසි සහ මලී මේ හැමෝම සතුටින් ජීවත් වුණා. අර තෑග්ග ලිලීටයි එයාගෙ අම්මටයි හම්බුනා.

නිමි !





## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළි දැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වනවිට ලේඛක අංකුර හැටදහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍යය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායීතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල්, කලාප , පළාත් , ජාතික හා ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි .

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි . මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය , දියණියන් , ගුරු භවතුන් , දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමි විය යුතුය .

මුද්‍රිත පොත තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස් වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටළු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි.මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණ යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගලපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත් කතුවර ඔබගේ ලේඛන දිවියට මාගේ සුභාෂිංසන.

ව්‍යාපෘතිය නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහ ලේකම්.